ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,
අංක 25, ගෝල්ෆේස් ටෙරසය,
කොළඹ 03.
.......................................
......................................
......................................

මහත්මයාණෙනි/මහත්මියනි,

**<u>මැණික් වෙළෙඳ/කැපීම් බලපත්‍ර නිකුත් කිරීම - 2015</u>**

01 2015 වර්ෂය සඳහා මැණික් වෙළෙඳාම/ මැණික් කැපීමේ (දියමන්ති කැපීම ඇතුලත්ව) බලපත්‍ර සඳහා අයදුම් කිරීමේදී පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

i. වර්ෂය තුළදී උපරිම වශයෙන් තබා ගැනීමට බලාපොරොත්තු වන මැණික් තොගයේ දළ වටිනාකම අනුව නව බලපත්‍ර ලබාගත යුතුවේ.

ii. ශාඛා ව්‍යාපාරික ස්ථාන සඳහා ද වෙන් වෙන් වශයෙන් බලපත්‍ර ලබාගත යුතුවේ.

iii. තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාරයක් හෝ සමාගමක් නම් මැණික් වෙළෙඳාමද ඇතුලත් සමාගම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්, පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද අදාල ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත සමග ඡායාස්ථිත පිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

iv. පෙර වර්ෂය සඳහා බලපත්‍ර ලබා ඇත්නම් එහි ජායාස්ථිත පිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

v. තමන්ගේ පෞද්ගලික නමට ලබාගන්නා බලපත්‍ර සම්බන්ධයෙන් ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍යවේ.

vi 2015 වර්ෂය සඳහා බලපත්‍ර දීර්ඝ කිරීම පිණිස **<u>2014.12.31</u>** දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කළයුතුය. ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් නියමිත බලපත්‍ර ගාස්තුවලට අමතරව පහත සඳහන් පරිදි ප්‍රමාද ගාස්තු අයකරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| **2015.01.01** | සිට | **2015.01.31** | දක්වා | **10%** |
| **2015.02.01** | සිට | **2015.06.30** | දක්වා | **20%** |
| **2015.07.01** | සිට | **2015.12.31** | දක්වා | **30%** |

vii. ආයතනයක් සම්බන්ධයෙන් නම් අදාල ආයතනයේ රබර් මුද්‍රාව අයදුම්පතේ යෙදිය යුතුය.

viii. වෙළෙඳ බලපත්‍ර සඳහා **<u>එක්දින සේවය යටතේ ඉල්ලුම් කරන්නේ නම් අමතර 1,000/- ක් සහ වැට් බද්ද (VAT) + ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) ගෙවිය යුතුය.</u>** එසේ බලපත්‍රය ලබා දෙනුයේ සියලු අවශ්‍යතා සම්පූර්ණ කර එදින මුදලින් පමණක් ගෙවන සේවාදායකයන්ට පමණි.

ix. **<u>මැණික් වෙළෙඳ</u>** වර්ණ කාඩ්පත් අයදුම් කරන්නන් සඳහා අදාල තොග සීමාවට යටත්ව එකී කාඩ්පත් නිකුත් කරනු ලබන අතර ඒ සඳහා රු. 750/- + වැට් බද්ද (VAT) + ජාතිය ගොඩනැගීමේ බද්ද(NBT) යන අමතර ගාස්තු අයකරනු ලැබේ. මැණික් වෙළෙඳ බලපත්‍ර ලබා ගන්නා අවස්ථාවේ දීම අයදුම්කරුගේ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ 'ඡායාරූප දෙකක් සමග වර්ණ කාඩ්පත් සඳහා අයදුම් කළයුතු අතර අදාල ගෙවීම්ද එම අවස්ථාවේදීම කළ යුතුය. **වර්ණ කාඩ්පත් සඳහා පසුව කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.**

x. **<u>මැණික් අපනයනකරුවන්</u>** සඳහා 2014 වසරේ අපනයන වටිනාකම අනුව වර්ණ කාඩ්පතක් නිකුත් කරන අතර, කාඩ්පත් වර්ගය අපනයන වටිනාකම අනුව තීරණය වේ. ඒ සඳහා රු. 750/- + වැට් බද්ද (VAT) + ජාතිය ගොඩනැගීමේ බද්ද(NBT) යන අමතර ගාස්තු අයකරනු ලැබේ. මැණික් වෙළෙඳ බලපත්‍ර ලබා ගන්නා අවස්ථාවේ දීම අයදුම්කරුගේ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් සමග වර්ණ කාඩ්පත් සඳහා අයදුම් කළයුතු අතර අදාල ගෙවීම්ද එම අවස්ථාවේදීම කළ යුතුය. **වර්ණ කාඩ්පත් සඳහා පසුව කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.**

**02 වෙළෙඳ /කැපීම් බලපත්‍ර සංශෝධනය**

i තොග සීමාව වැඩි කිරීම සමග ව්‍යාපාර ලියාපදිංචියේ ඕනෑම වෙනස්වීමක් සඳහා මෙන්ම බලපත්‍රය දුර්වර්ණවීම, අපවිත්‍ර වීම, අපහැදිලිවීම, නැතිවීම වැනි කරුණු සම්බන්ධයෙන් බලපත්‍රයක් සංශෝධනය කිරීමට සිදුවුවහොත්, එවැනි අවස්ථාවලදී නව බලපත්‍රයක් නිකුත් කරනු ලබන අතර ඒ සඳහා **<u>රුපියල් 200/- + වැට් බද්ද (VAT) + ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) අයකෙරේ</u>**, පුද්ගලික නමට නිකුත් කළ වෙළෙඳ බලපත්‍රයක් අයදුම්කරුගේ ඉල්ලීම මත ව්‍යාපාර නාමය යටතට සංශෝධනය කර නව වෙළෙඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා **<u>රුපියල් 500/- (VAT) + ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) අයකරනු ලැබේ.</u>**

ii බලපත්‍රධාරියෙකු දැනට මැණික් වෙළෙඳාම/මැණික් කැපීම නවතා ඇත්නම් ඒ බැව් අප්‍රමාදව ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලියාපදිංචි තැපෑලෙන් දන්වා එවිය යුතුය. **<u>එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව නව බලපත්‍රයක් අයදුම් කිරීමේදී ප්‍රමාද වූ කාලය සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවේ.</u>**

iii තනි පුද්ගල /හවුල් /ලියාපදිංචි සමාගම් තම ව්‍යාපාර ලිපිනය වෙනස් කර අලුත් ව්‍යාපාරික ස්ථානයකට බලපත්‍රයක් ඉල්ලා සිටින්නේ නම් ඒ සඳහා සංශෝධිත ලියාපදිංචි කිරීමේ සහතිකය සමග එහි ජායාස්ථිත පිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුවේ. (මුල් පිටපත පරීක්ෂා කර බලා ආපසු භාර දෙනු ලැබේ.)

03 වෙළෙඳ බලපත්‍ර ගාස්තු

i **තොගයේ වටිනාකම** — **බලපත්‍ර ගාස්තුව**

| | |
|---|---|
| රු. 100,000/- දක්වා | රු 1,200/- |
| රු. 500,000/- දක්වා | රු 3,000/- |
| රු. 1,000,000/- දක්වා | රු 5,000/- |
| රු. 2,000,000/- දක්වා | රු 10,000/- |
| රු. 3,000,000/- දක්වා | රු 12,000/- |
| රු. 5,000,000/- දක්වා | රු 16,500/- |
| රු. 10,000,000/- දක්වා | රු 20,000/- |
| රු. 10,000,000/- ට වැඩි | රු 25,000/- |

ii **මැණික් කැපීමේ බලපත්‍ර**

මැණික් කැපීමේ යන්ත්‍ර 01 - 10 දක්වා රු 500/- කි
යන්ත්‍ර 10 ට වඩා වැඩි නම් සෑම යන්ත්‍රයකට රු 100/- බැගින්

iii **දියමන්ති කැපීමේ බලපත්‍ර**

| | |
|---|---|
| යන්ත්‍ර 01 - 50 දක්වා | රු 7,000/- |
| යන්ත්‍ර 51 - 100 දක්වා | රු 9,500/- |
| යන්ත්‍ර 100 ට වැඩි | රු 11,000/- |

උප කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති දියමන්ති කැපුම්කරුවන් සඳහා පහත සඳහන් පරිදි බලපත්‍ර ගාස්තු අයකරනු ලැබේ.

| | |
|---|---|
| යන්ත්‍ර 01-05 දක්වා | රු 700/- |
| යන්ත්‍ර 06-10 දක්වා | රු 1,400/- |
| යන්ත්‍ර 11-20 දක්වා | රු 2,750/- |
| යන්ත්‍ර 21-30 දක්වා | රු 4,100/- |
| යන්ත්‍ර 31-50 දක්වා | රු 5,500/- |
| යන්ත්‍ර 50 ට වැඩි | රු 6,900/- |

iv ඉහත බලපත්‍ර ගාස්තු වලට අතිරේක වශයෙන් පහත සඳහන් ගාස්තු අයකරනු ලැබේ.

- වැට් බදු — 12%
- ජාතිය ගොඩනැගීමේ බදු — 02%
- රජයේ අනුමත මුද්දර ගාස්තු — 10% (රු.2,000/- උපරිමයට යටත්ව)

v සියලුම ගෙවීම් මුදලින් හෝ ''ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය'' නමින් ලියා රේඛනය කර ලද චෙක්පතකින් ගෙවිය හැකිය. **චෙක්පත් මගින් මුදල් ගෙවනු ලබන අවස්ථාවලදී බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ චෙක්පත් උපලබ්ධිවීමෙන් පසුව පමණි.**

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
කොළඹ කාර්යාලය : අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03
දුරකතන : 2325364, 2329295, 2390645, 2390651
විද්‍යුත් තැපෑල : ngjacolr@sltnet.lk
වෙබ් අඩවිය : www.ngja.gov.lk